සියලු හිමිකම් ඇවිරිණි/ All Rights reserved

වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
Provincial Department of Education - NWP

60 | S | I

පළමු වාර පරීක්ෂණය - 11 ශ්‍රේණිය - 2018
First Term Test - Grade 11 - 2018

විභාග අංකය .................................... **ව්‍යාපාර හා ගිණුම්කරණ අධ්‍යනය I** කාලය පැය 01 යි

සැලකිය යුතුයි.
- සියළුම ප්‍රශ්න වලට පිළිතුරු සපයන්න.
- අංක 1 සිට 40 දක්වා ප්‍රශ්න වලදී 1, 2, 3, 4 යන පිළිතුරු අතරින් නිවැරදි හෝ වඩා ගැලපෙන හෝ පිළිතුර තෝරා ගන්න.
- ඔබට සැපයෙන පිළිතුරු පත්‍රයේ එක් එක් ප්‍රශ්නය සඳහා දී ඇති කව අතුරින් ඔබ තෝරා ගත් පිළිතුරෙහි අංක - යට සලසා දෙන කවය තුළ (*x*) ලකුණ යොදන්න.

☒ **පහත සඳහන් සිද්ධිය ඇසුරින් ප්‍රශ්න අංක 1 සිට 4 තෙක් ප්‍රශ්න වලට පිළිතුරු සපයන්න.**

තම සැමියාගේ සහය ඇතිව ප්‍රදේශයෙන්ම පොල්කටු මිළදී ගන්නා සඳමිණි, පොල්කටු ආශ්‍රිත විසිතුරු ආභරණ නිෂ්පාදන කිරීමේ ව්‍යාපාරයක් "නේචර් ප්‍රඩක්ස්" නමින් පවත්වාගෙන යයි.

(01) මෙම සිද්ධියේ සඳහන් "නේචර් ප්‍රඩක්ට්ස්" ව්‍යාපාරය විසින් සපුරාලනු ලබන මූලික මිනිස් අවශ්‍යතාව කුමක්ද?
1. අධ්‍යාපනය 2. විනෝදය 3. ආහාර 4. ඇඳුම්

(02) මෙම සිද්ධියේ සඳහන් "නේචර් ප්‍රඩක්ට්ස්" ආයතනය අයත්වන ව්‍යාපාර සංවිධාන වර්ගය කුමක්ද?
1. හවුල් ව්‍යාපාර 2. තනි පුද්ගල ව්‍යාපාර 3. සංස්ථාපිත සමාගම් 4. සමිති සමාගම්

(03) විසිතුරු ආභරණ නිෂ්පාදනය සඳහා භාවිතා කරන පොල්කටු අයත් වන නිෂ්පාදන සාධකය වනුයේ,
1. භූමි ය. 2. ශ්‍රමය. 3. ප්‍රාග්ධනය. 4. ව්‍යවසාය.

(04) ඉහත සිද්ධියේ සඳහන් "නේචර් ප්‍රඩක්ට්ස්" ව්‍යාපාරයට සම්බන්ධ නිවැරදි ප්‍රකාශය වනුයේ,
1. මෙම ව්‍යාපාරයට නීතිමය පුද්ගලභාවයක් ඇත.
2. මෙම ව්‍යාපාරය සම්බන්ධව සඳමිණිගේ වගකීම සීමිතය.
3. මෙම ව්‍යාපාර නාමය ලියාපදිංචි කිරීම අනිවාර්ය වේ.
4. මෙම ව්‍යාපාරය සම්බන්ධව සඳමිණීට තනි තීරණ ගත නොහැකිය.

(05) ව්‍යාපාරයක ................. තීරණ ගැනීම හා තීරණ ක්‍රියාත්මක කිරීමට බලාපොරොත්තු වන අතර .............. රැකියාවේ සුරක්ෂිත බව අපේක්ෂා කරයි.
ඉහත ප්‍රකාශයේ 1 හා 2 යන ස්ථාන වලට අදාළ නිවැරදි යෙදුම් පිළිවෙලින් දැක්වෙන පිළිතුර තෝරන්න.
1. තරඟකරුවෝ, සේවකයෝ. 2. අයිතිකරුවෝ, සේවකයෝ.
3. කළමනාකරුවෝ, සේවකයෝ. 4. සේවකයෝ, කළමණාකරුවෝ.

(06) ව්‍යාපාර පරිසරයේ සිදුවූ සිදුවීම් කිහිපයක් පහත දැක්වේ.
A - මාර්ග පහසුකම් දියුණු කිරීම.
B - ණය සඳහා පොළී අනුපාතය ඉහළ යාම.
C - බදු ප්‍රතිපත්ති ගෙනඒම.
ඉහත සිදුවීම් අතුරින් දේශපාලන පරිසර සාධක පමණක් ඇතුළත් පිළිතුර වන්නේ,
1. A හා B ය. 2. B හා C ය. 3. A හා C ය. 4. A,B හා C ය.

(07) ස්ථාවර සුළු පරිමාණ සිල්ලර වෙළඳසැලක් ලෙස නොසැලකෙන්නේ,
1. ග්‍රොසරි 2. බාබර් සාප්පු 3. සුපිරි වෙළඳසැල් 4. රූපලාවන්‍ය ආයතන

(08) සමීර බංඩාර ධාන්‍ය පිටි නිෂ්පාදන ව්‍යාපාරයක නිරතවන අතර ඔහු තම ජංගම ගිණුම මහජන බැංකුවේ කුරුණෑගල ශාඛාවේ පවත්වාගෙන යයි. ඔහු රු.250000ක් වටිනා යන්ත්‍රයක් 2018.01.16 දින ප්‍රභාත් දිසානායකගෙන් මිලට ගත්තේය. එම වටිනාකම ඔහු චෙක් පතකින් ගෙවන ලදී. මෙහි අණලදු කවරෙක්ද?
1. ප්‍රභාත් දසනායක. 2. මහජන බැංකුවේ කුරුණෑගල ශාඛාව.
3. සමීර බණ්ඩාර. 4. මේ කිසිවෙකුත් නොවේ.

(09) පහත දී ඇත්තේ විද්‍යුත් මුදල් වර්ග කිහිපයකි.

A - සී බැන්ක් වීසා

B - කැට් සුපර්

C - පීපල්ස් වීසා

මේවා අතුරින් ණයපත් ලෙස සැලකිය හැක්කේ,

1. A හා B ය. 2. B හා C ය. 3. A හා C ය. 4. A,B හා C ය.

(10) රු. ලක්ෂ 10ක් වටිනා සම්පත් සතු මෝටර් රථය එම මුදලටම රක්ෂණය කර තිබුණි. හදිසි අනතුරකින් මෝටර් රථයට රු.ලක්ෂ 2ක හානියක් සිදුවී ඇත. අදාල රක්ෂණ සමාගමෙන් සම්පත්ට රක්ෂණ වන්දි ලෙස රු.ලක්ෂ 2ක් ලැබුණි.

මෙයට අදාළ රක්ෂණ මූලධර්මය වන්නේ,

1. උපරිම විශ්වාසය 2. රක්ෂණ හිමිකම 3. ආසන්නතම හේතුව 4. හානි පූර්ණය

(11) සන්නිවේදන ක්‍රම කිහිපයක් පහත දැක්වේ.

A - දුරකතන B - SMS C - විද්‍යුත් තැපැල D - ස්කයිප්

ඉහත සන්නිවේදන ක්‍රම අතුරින් විද්‍යුත් හා වාචික සන්නිවේදන මාධ්‍යයට වැටෙන්නේ,

1. A හා B ය. 2. A හා D ය. 3. B හා C ය. 4. B හා D ය.

(12) ප්‍රවාහන ........①........ මගින් වරකට ගෙන යා හැකි භාණ්ඩ ප්‍රමාණය ........②........ නම් වේ.

ඉහත ප්‍රකාශයේ 1 හා 2 ස්ථානවලට අදාල නිවැරදි යෙදුම් පිළිවෙලින් දක්වෙන පිළිතුර වන්නේ,

1. මාධ්‍යය, ධාරිතාව 2. පර්යන්තය, සුලබතාව 3. මාර්ගය, ධාරිතාව 4. බලය, පිරිවැය

(13) කළමනාකරණ කාර්යයන් අතුරින් මෙහෙයවීමට අයත් වන්නේ,

1. ව්‍යාපාර කටයුතු සැලසුම් කළ ආකාරයෙන්ම සිදුවී ඇත්දැයි සොයා බැලීමේ ක්‍රියාවලියයි.
2. ව්‍යාපාරයේ මානව සම්පත් නිසිලෙස හැසිරවීමේ ක්‍රියාවලියයි.
3. ව්‍යාපාර අරමුණු සපුරා ගැනීමට අවශ්‍ය සම්පත් හා තොරතුරු වැඩ බෙදා හැරීම සම්බන්ධ ක්‍රියාවලියයි.
4. ව්‍යාපාර අරමුණු තීරණය කිරීම හා අරමුණු ඉටුකර ගැනමේ ක්‍රම සහ විධි තීරණය කිරීම.

(14) A - ගුණත්වය E - පිහිටීම

B - වට්ටම් F - ප්‍රවාහනය

C - බෙදාහැරීම G - ප්‍රචාරණය

D - දීමනා H - ගෙවීම් ක්‍රම

අලෙවිකරණයේ විචල්‍යයන්ට අයත් අයිතම ඉහත දක්වේ. ඒ අයිතම අතරින් මිල විචල්‍යට අදාල අයිතම වන්නේ,

1. ABC 2. DEF 3. BDH 4. FGH

(15) අලෙවිකරණයට අයත් කටයුත්තක් නොවන්නේ,

I. මිනිස් අවශ්‍යතා හා වුවමනා තෘප්තිමත් කළ හැකි භාණ්ඩ හා සේවා නිෂ්පාදනය කිරීම.
2. සාධාරණ මිලක් ලකුණු කිරීම.
3. භාණ්ඩ හා සේවා පාරිභෝගිකයා වෙත බෙදා හැරීම.
4. ප්‍රචාරණ උපක්‍රම අනුගමනය කරමින් පාරිභෝගිකයා ආකර්ශනය කර ගැනීම.

(16) ව්‍යාපාරික අරමුණ අපේක්ෂිත ආකාරයටම ඉටුකර ගැනීම .................① ලෙසද අවම සම්පත් ප්‍රමාණයකින් උපරිම ප්‍රයෝජන ලැබෙන පරිදි සම්පත් භාවිතා කිරීම ....................② ලෙසද හැඳින්වේ. ඉහත ප්‍රකාශයේ 1 හා 2 පිළිවෙලින් දක්වෙනුයේ,

1. කාර්යක්ෂමතාව , සඵලදායිතාව. 2. ඵලදායිතාව , කාර්යක්ෂමතාව.

3. කාර්යක්ෂමතාව , ඵලදායිතාව. 4. සඵලදායිතාව , කාර්යක්ෂමතාව.

(17) "රු.25,000ක භාණ්ඩ තොගයක් අයිතිකරු විසින් පෞද්ගලික ප්‍රයෝජනයට ගැනීම" මෙම ගනුදෙනුව ගිණුම්කරණ සමීකරණයේ නිවැරදිව දක්වා ඇති පිළිතුර තෝරන්න.

| වත්කම් (රු) | = | අයිතිකරුගේ හිමිකම (රු) | + | වගකීම (රු) |
|---|---|---|---|---|
| 1. +25 000 | = | +25 000 | | - |
| 2. -25 000 | = | -25 000 | | |
| 3. -25 000 | = | | | -25 000 |
| 4. - | = | -25 000 | | -25 000 |

(18) පහත ගණුදෙනු අතුරෙන් වගකීමක් අඩුවන ගනුදෙනුව වන්නේ,

1. වැටුප් රු. 5000/= ක් මුදලින් ගෙවීම.
2. රුවන්ගෙන් රු.15000/=ක භාණ්ඩ තොගයක් ණයට ගැනීම.
3. රු.2000/= ක ණයහිමියන්ට ගෙවීම.
4. ව්‍යාපාරයට රු.6000ක කුලී ආදායමක් ලැබීම.

(19) ලෙජරයේ ඇති "ලද වට්ටම් ගිණුම" හා "ණයගැති ගිණුම" පිළිවෙලින් අයත් වන ගිණුම් කාණ්ඩය වන්නේ,

1. හිමිකම් හා වගකීම්. 2. හිමිකම් හා වත්කම්. 3. ආදායම් හා වගකීම්. 4. ආදායම් හා වත්කම්.

(20) "අඩුවන විට - හර හා වැඩිවන විට - බැර" කිරීම සිදුකරනු ලබන ගිණුම වන්නේ,

1. ප්‍රාග්ධන ගිණුම 2. ණයගැති ගිණුම 3. වැටුප් වියදම් ගිණුම 4. මුදල් ගිණුම

(21) පහත ප්‍රකාශ අධ්‍යයනය කරන්න.

A - ව්‍යාපාරයට පාලනය කළ හැකි වීම.

B - අතීත ගණුදෙනුවක ප්‍රතිඵලයක් වීම.

C - වර්ථමාන බැඳීමක් තිබීම.

D - බේරුම් කිරීමේදී සම්පත් වලින් කොටසක් පිටතට ගලා යාම.

මේවායින් වත්කමක ලක්ෂණ පමණක් දැක්වෙන්නේ,

1. A හා B පමණි. 2. A හා C පමණි. 3. A,B හා C පමණි. 4. B,B හා D පමණි.

(22) රාධිකාගේ ව්‍යාපාරයේ 2017.12.31 න් අවසාන වූ වර්ෂය සඳහා පහත තොරතුරු අදාල වේ.

| | | |
|---|---|---|
| 2017.01.01 දිනට අයිතිකරුගේ හිමිකම | - | 351,000.00 |
| 2017.12.31 දිනට අයිතිකරුගේ හිමිකම | - | 460,000.00 |
| වර්ෂයේ ආදායම | - | 240,000.00 |
| වර්ෂයේ වියදම | - | 165,000.00 |

රාධිකා විසින් මෙම වර්ෂය තුළ ව්‍යාපාරයට යෙදවූ අමතර ප්‍රාග්ධනයේ වටිනාකම කොපමණද?

1. රු. 34,000 කි. 2. රු. 75,000 කි. 3. රු. 109,000 කි. 4. රු. 184,000 කි.

- **පහත තොරතුරු ඇසුරින් 23 හා 24 ට පිළිතුරු සපයන්න.**

රංගගේ ව්‍යාපාරයේ ණයගැතියෙකු වූ සුරංගගේ ණයගැති ශේෂය රු.12,000ක් විය. මෙම ණය මුදල සඳහා රංග විසින් සුරංගට 5%ක මුදල් වට්ටමක් පිරිනමන ලදී.

(23) සුරංගට ගෙවීමට සිදුවූ මුදල කොපමණද?

1. රු.13200 කි. 2. රු. 12600 කි. 3. රු.11400 කි. 4. රු.10800 කි.

(24) රංගගේ ව්‍යාපාරයේ මෙම ණයගැති ගනුදෙනුව වාර්තා කිරීමේ නිවැරදි ද්විත්ව සටහන කුමක්ද?

1. මුදල් - හර රු. 12000
   ණයගැති ගිණුම - බැර රු. 12000

2. මුදල් - හර රු. 11400
   දුන් වට්ටම් - හර රු. 600
   ණයගැති ගිණුම - බැර 12000

3. මුදල් - හර රු. 11400
   ලද වට්ටම් - හර රු. 600
   ණයගැති ගිණුමට බැර - රු. 12000

4. මුදල් - හර රු. 11400
   ලද වට්ටම් - හර රු. 600
   ණයහිමි ගිණුමට - බැර රු. 12000

(25) මුදල් පොතේ මුදල් ලැබීම් වාර්තා කිරීම සඳහා අදාල මූලාශ්‍ර ලේඛනය වන්නේ,

1. ඉන්වොයිසය 2. හරපත 3. ලදුපත 4. වවුචරය

(26) ව්‍යාපාරයක් තම ණයහිමියෙකුට රු.12 000ක චෙක්පතක් නිකුත්කිරීමේදී භාවිතාකරන මූලාශ්‍ර ලේඛනය ①............. වන අතර මූලික සටහන් පොත ②................ වේ. ඉහත 1 හා 2 යන ස්ථාන දෙක නිවැරදි පිළිතුර වන්නේ,

1. ලදුපත - බැංකු ගිණුම. 2. චෙක් පිළිපත - මුදල් පොත.
3. ගෙවීම් වවුචරය - මුදල් පොත. 4. ගෙවීම් වවුචරය - බැංකු ගිණුම.

- **පහත තොරතුරු ඇසුරින් ප්‍රශ්න අංක 27 හා 28 පිළිතුරු සපයන්න.**

2017.12.31 දිනට බැංකු ගිණුමේ ශේෂය රු.680 000කි. එය එදිනට බැංකු ප්‍රකාශනයේ ශේෂය සමඟ එකග නොවීය. වෙනසට පහත හේතු බලපා ඇත.

A - ස්ථාවර නියෝග මත ගෙවූ රු.10 000ක රක්ෂණ වාරිකය තිබීම.

B - තැම්පත් කළ නිෂ්කාශන නොවූ චෙක්පත රු.40 000කි.

C - බැංකුව අයකළ බැංකු ගාස්තුව රු.2000 කි.

(27 ඉහත හේතු අතුරින් බැංකු ප්‍රකාශනයේ ශේෂයට වඩා බැංකු ගිණුමේ ශේෂය වැඩි වීමට හේතු වන්නේ,

1. A පමණි. 2. A හා B පමණි. 3. B පමණි. 4. B හා C පමණි.

(28) 2017.12.31 දිනට සංශෝධිත බැංකු ශේෂය වන්නේ,

1. රු. 668,000 2. රු.670,000 3. රු.692,000 4. රු.708,000

(29) ගණුදෙනුවක් සටහන් කිරීමට අදාල ද්විත්ව සටහන පහත දැක්වේ.

ණයගැති ගිණුම හර - 8000
බැංකු ගිණුම බැර - 8000

සිදුව ඇති ගණුදෙනුව වන්නේ,

1. ණයගැතියන්ගෙන් ලැබූ චෙක්පත බැංකුවේ තැන්පත් කළ රු. 8000යි.
2. ණයගැතියෙකුගේ රු. 8000ක් ලැබීමයි.
3. රු. 8000ක බඩු තොගයක් ණයට විකිණීමයි.
4. රු. 8000ක ණය ගැතියන්ගෙන් ලැබී බැංකුවේ තැන්පත් කළ චෙක්පත අගරු වීමය.

(30) මහේලගේ ව්‍යාපාරයේ දෙසැම්බර් මාසයට අදාල සුළු වියදම් වල එකතුව රු. 1750 ක් වන අතර අත ඉතිරි මුදල රු. 250කි. ව්‍යාපාරයේ සුළු මුදල් අග්‍රිමය කොපමණද?

1. රු. 250 කි. 2. රු. 1500 කි. 3. රු. 17500 කි. 4. රු. 2000 කි.

(31) පහත දැක්වෙන්නේ ඉන්වොයිසියකින් උපුටා ගත් විකුණුම් කොන්දේසියකි.

5 / 45 / ශුද්ධ 90

ඉහත කොන්දෙසි අනුව වට්ටම් ලබා ගැනීම සඳහා ණය බේරුම් කළයුතු වන්නේ,

1. ණය ලබාගෙන දින 5කට පසුව ය. 2. ණය ලබාගෙන දින 45ක් ඇතුළත ය.
3. ණය ලබාගෙන දින 45කට පසුව ය. 4. ණය ලබාගෙන දින 90 ඇතුළත ය.

(32) විකුණුම් ජ'නල පිළියෙල කිරීමෙන් පසු එහි ශේෂය,

1. විකුණුම් ගිණුමට හර කරයි. 2. ණයගැති ගිණුමට හර කරයි.
3. විකුණුම් ගිණුමට බැර කරයි. 4. ණයගැති ගිණුමට බැර කරයි.

(33) පහත සඳහන් ගණුදෙනු අතරින් පොදු ජ'නලය තුළ සටහන් කරන ගනුදෙනු පමණක් ඇති කාණ්ඩය තෝරන්න.

1. මුදල් ලැබීම, භාණ්ඩ ණයට විකුණුම්,මෝටර්රථ ණයට ගැනීම.
2. මෝටර්රථ ණයට විකුණුම්, වැරදි නිවැරදි කිරීමේ සටහන්, යන්ත්‍ර ණයට ගැනීම.
3. ණයගැති ලැබීම්,වියදම් මුදලින් ගෙවීම,භාණ්ඩ මිලදී ගැනීම.
4. මෝටර්රථ මුදලට විකිණීම, වියදම් ගෙවීම්, භාණ්ඩ ණයට විකිණීම.

(34) ශේෂ පිළියෙල කිරීමේදී එහි හර තීරුවේ පමණක් සටහන් කරන ගිණුම් දැක්වෙන කාණ්ඩය තෝරන්න.

1. යන්ත්‍ර ගිණුම, ප්‍රාග්ධන ගිණුම, ණයගැති ගිණුම, මුදල් ගිණුම.
2. යන්ත්‍ර ගිණුම, බැංකු ගිණුම, ණයගැති ගිණුම, ගැනුම් ගිණුම.
3. යන්ත්‍ර ගිණුම, ගැනුම් ගිණුම, විකුණුම් ගිණුම, ආදායම් ගිණුම.
4. යන්ත්‍ර ගිණුම, ණයගැති ගිණුම, ණයහිමි ගිණුම, ගැනුම් ගිණුම.

(35) විදුලි වියදම් වශයෙන් ගෙවූ රු.7000ක් විදුලි වියදම් ගිණුමේ රු.700ක් ලෙස සටහන් වීමේ වැරැද්ද නිවැරදි කිරීමට අදාල ජ'නල සටහන වනුයේ,

1. විදුලි වියදම් ගිණුම හර 6300
   අවිනිශ්චිත ගිණුම බැර 6300
2. විදුලි වියදම් ගිණුම හර 700
   අවිනිශ්චිත ගිණුම බැර 700
3. අවිනිශ්චිත ගිණුම හර 6300
   විදුලි වියදම් ගිණුම බැර 700
4. විදුලි වියදම් ගිණුම හර 6300
   මුදල් පොත බැර 6300

(36) පොලී ආදායම් ගිණුමේ ශේෂය වූ රු.1700ක අගය ශේෂ පිරික්සුමේ හර පැත්තේ සටහන් වීම නිසා,

1. අවිනිශ්චිත ගිණුමේ රු.1700ක බැර ශේෂයක් පවතී.
2. අවිනිශ්චිත ගිණුමේ රු.1700ක හර ශේෂයක් පවතී.
3. අවිනිශ්චිත ගිණුමේ රු.3400ක බැර ශේෂයක් පවතී.
4. අවිනිශ්චිත ගිණුමේ රු.3400ක හර ශේෂයක් පවතී.

(37) අමිලගේ ව්‍යාපාරයේ පොදු ජ'නලය වූ ජ'නල සටහනක් පහත පරිදි වේ.

දුරකථන වියදම් ගිණුම හර 1000
අවිනිශ්චිත ගිණුම බැර 1000

ඉහත සිදුවී ඇති වැරැද්ද වන්නේ,

1. දුරකථන ගාස්තු වශයෙන් ගෙවූ රු.1000ක අගය සම්පූර්ණයෙන්ම මඟහැරී තිබීම.
2. දුරකථන ගාස්තු වශයෙන් ගෙවූ රු. 1000අගය දුරකථන වියදම් ගිණුමේ සටහන් නොවීම.
3. රු.1000ක දුරකථන ගාස්තු එම ගිණුමේ බැර පැත්තේ සටහන් විම.
4. රු.1000ක දුරකථන වියදම් ගිණුමේ ශේෂය ශේෂ පිරික්සුමට පිටපත් නොවීම.

(38) ජංගම දුරකථන බැංකුකරණයේ අවාසියක් වනුයේ,

1. ගනුදෙනු කිරීමට පහසු වීම.
2. මූල්‍යමය ගනුදෙනු ඉතා ඉක්මණින් සපුරා ගත හැකි වීම.
3. තාක්ෂණික දෝෂ.
4. කාලය හා ශ්‍රමය ඉතිරි විම.

(39) ව්‍යාපාරයක් විසින් ගිණුම් වර්ෂය අවසානයේ පිළියෙල කරනු ලබන ලාභ හෝ අලාභ ප්‍රකාශය පිළියෙල කිරීමේ අරමුණ වනුයේ

1. ව්‍යාපාරයේ මූල්‍ය තත්වය දැන ගැනීමට.
2. මෙහෙයුම් කටයුතු වල ප්‍රතිඵල දැන ගැනීමට.
3. දළ ලාභය දැන ගැනීමට.
4. වර්ෂයේ ආදායම් හා වියදම් දැන ගැනීමට.

(40) සඳ ලංකා ව්‍යාපාරය එකක් රු: 300 බැගින් ටී ෂර්ට් 50ක් අමල් ව්‍යාපාරයෙන් ගැනීමේදී අඩු කල වට්ටම 10% කි. මෙම ගනුදෙනුව හේතුවෙන්,

1. දුන් වට්ටම් 3000 කින් වැඩි විය.
2. රු: 30000ක ණය ගැති ශේෂයක් ඇති විය.
3. රු 27000ක ණය ගැති ශේෂයක් ඇති විය.
4. රු: 30000 ක ණය හිමි ශේෂයක් ඇති විය.

සියලු හිමිකම් ඇවිරිණි/ All Rights reserved

වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව Provincial Department of Education

# වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
# Provincial Department of Education - NWP

**60 | S | II**

පළමු වාර පරීක්ෂණය - 11 ශ්‍රේණිය - 2018

First Term Test - Grade 11 - 2018

විභාග අංකය .................................... **ව්‍යාපාර හා ගිණුම්කරණ අධ්‍යයනය II** කාලය පැය 02 යි

සැලකිය යුතුයි.
- පළමුවන ප්‍රශ්නය ඇතුළුව පළමු කොටසෙන් ප්‍රශ්න දෙකක්ද, II කොටසින් ප්‍රශ්න දෙකක් ද, බැගින් ප්‍රශ්න පහකට පමණක් පිළිතුරු සපයන්න.

## I කොටස

**(01) පහත සඳහන් සිද්ධි ඇසුරින් අංක i සිට x දක්වා ප්‍රශ්න වලට පිළිතුරු සපයන්න.**

දිනෙත් පෙරේරා අ.පො.ස උසස් පෙළින් පසු වීඩියෝ හා ඡායාරූපකරණය පිළිබඳ පාඨමාලාවක් හැදෑරීය. ඔහුගේ සහෝදරිය වන නෙත්මිණී පෙරේරා රූපලාවන්‍ය පාඨමාලාවක් හදාරා නිවසට වී කාලය ගත කරමින් සිටියාය. ඔවුන් දෙදෙනාගේ එකඟතාවයෙන් ව්‍යාපාරයක් ආරම්භ කිරීම සඳහා ව්‍යාපාර පිළිබඳ උපදෙස් ලබාදෙන ආයතනයකින් උපදෙස් ලබාගන්නා ලදී. ඒ අනුව ඔවුන් "දිනෙත් මංගල්‍යය" නමින් ව්‍යාපාරයක් ආරම්භ කරන ලදී. ඔවුන් විසින් ආරම්භ කරන ලද ව්‍යාපාර ආයතනය විශේෂයෙන්ම මංගල ඇඳුම් හා ආභරණ සැපයීම, මනාලියන් හැඩ ගැන්වීම, මල් සැරසිලි, මංගල රථ සැරසිලි හා මංගල ඡායාරූප හා වීඩියෝකරණය ආදී සියල්ල එකම ස්ථානයෙන් සපුරාලීම ඔවුන්ගේ විශේෂත්වයයි. ඒ සඳහා සියලු අංශ වලට විශේෂ හැකියාවක් සහිත සේවකයක් බඳවා ගන්නා ලදී.

ඔවුන් ව්‍යාපාර කටයුතු ඇරඹීම සඳහා 2018.01.01 දින මුදලින් රු. 400,000ක් ද රු. 700,000 ක් වටිනා නගරයේ බස්නැවතුම්පල අසල ඇති ගොඩනැගිල්ලද ඔවුන් විසින් යොදවන ලදී. එදිනම රු. 500,000 ක බැංකු ණයක් ලබාගන්නා ලදී.

2018.01.02 දින පහත ගණුදෙනු සිදුවිය.

| | |
|---|---|
| සැරසිලි වලට අවශ්‍ය මල් මිලදී ගත්තා | රු. 75,000 |
| මංගල ඇඳුම් මිලදී ගත්තා | රු. 250,000 |
| රූපලාවන්‍ය උපකරණ හා ද්‍රව්‍ය ගැණුම් | රු. 150,000 |
| කැමරා සහ වීඩියෝ උපකරණ ගත්තා | රු. 400,000 |

නගරයේ තවත් ඔවුන්ගේම සේවා සපයන ආයතනයක් තිබුණද, ජනවාරි මාසයේ මංගල උත්සව 03ක් භාරගෙන සාර්ථකව අවසන් කරනු ලැබීය.එම මාසය තුළ පහත ගණුදෙනු සිදුවිය.

| | |
|---|---|
| මංගල උත්සවය සඳහා අදාල වියදම් සඳහා ගෙවීම් | රු. 500,000 |
| ආදායම් වශයෙන් ලැබූ මුදල් | රු. 1,000,000 |
| කාර්මික ශිල්පීන්ට ගෙව්වා | රු. 200,000 |
| විදුලි වියදම් ගෙව්වා | රු. 20,000 |

ඉදිරියේදී මෙම ව්‍යාපාරය සංස්ථාපිත සමාගමක් බවට පරිවර්තනය කිරීමට ඔවුන් තීරණය කරන ලදී.

1. (අ) "දිනෙත් මංගල්‍යය" ව්‍යාපාරයේ නිෂ්පාදිතය ව්‍යාපාරයේ ස්වභාවය අනුව නම් කරන්න.
   (ආ) මෙම ව්‍යාපාරය අයත් වන ව්‍යාපාර සංවිධාන වර්ගය නම් කරන්න.
2. "දිනෙත් මංගල්‍යය" ව්‍යාපාරය ලියාපදිංචි කළ යුතු බව නෙත්මිණී ප්‍රකාශ කරයි.
   (අ) ඉහත ප්‍රකාශය සමඟ ඔබ එකඟ වන්නේද?
   (ආ) ඔබේ පිළිතුරට හේතු දක්වන්න.
3. (අ) මෙම සිද්ධියේ සඳහන් ඇල්මැති පාර්ශව 02ක් නම් කරන්න.
   (ආ) "දිනෙත් මංගල්‍යය" ව්‍යාපාරයට අදාල අභ්‍යන්තර පරිසර සාධකයක් සහ බාහිර පරිසර සාධකයක් නම් කරන්න.
4. (අ) මෙම සිද්ධියේ සඳහන් සැලසුම්කරණයට හා සංවිධානකරණයට අදාල කාර්ය සඳහා නිදසුන බැගින් ලියන්න.

5. 2018.01.01 දිනට මෙම ව්‍යාපාරයේ ගිණුම්කරණ සමීකරණය ලියා දක්වන්න.
6. මෙම ව්‍යාපාරයේ ගණුදෙනු ගිණුම්ගත කිරීමට අදාල මූලික පොත් 02 සහ ඊට අදාල මූලාශ්‍ර ලේඛන 02ක් ලියා දක්වන්න.
7. මංගල උත්සව විදුලි වියදම් ගෙවීමට අදාල ගණුදෙනුව ගිණුම් ගත කිරීමට අදාල ද්විත්ව සටහන අගයන් සහිතව ලියා දක්වන්න.
8. 2018.12.31 දිනට අත ඉතිරි මුදල ගණනය කරන්න.
9. මෙම ව්‍යාපාරයේ ජංගම නොවන වත්කම් හා ජංගම නොවන වගකීමක් ලියා දක්වන්න.
10. 2018.01.31 දිනට මෙම ව්‍යාපාරයේ හිමිකම ගණනය කරන්න.

## II කොටස

(02) 1. (අ) පාරිභෝගික අවශ්‍යතාවයක් යනු කුමක්ද?
(ආ) මිනිස් අවශ්‍යතා හා වුවමනා අතර වෙනස්කම් 2ක් ලියන්න. (ලකුණු 02)

2. පහත සඳහන් ප්‍රකාශ සත්‍යද අසත්‍යද යන්න දක්වන්න.
(අ) භාණ්ඩ හුවමාරු ක්‍රමය බාටර් ක්‍රමය ලෙස හැඳින්වේ.
(ආ) සිල්ලර වෙළෙඳ ආයතනය සේවා සැපයීමේ ව්‍යාපාරයකි.
(ඉ) ගොඩනැගිලි, භූමියට අයත් නිෂ්පාදන සාධකයකි.
(ඊ) ව්‍යාපාරය පිළිබඳ අයිතිකරුවන්ගේ තීරණ ක්‍රියාත්මක කරන්නේ කළමනාකරුවන්ය. (ලකුණු 02)

3. නිර්මාල් ප්‍රදේශයේ විවිධ ස්ථාන වලින් ශාක කොටස් ගස් වල මුල් සොයාගෙන රූක් කලා නිර්මාණය කර සංචාරකයින් සඳහා අලෙවි කරයි.
(අ) මෙම සිද්ධියේ සඳහන් නිෂ්පාදන සාධක 02ක් ලියන්න.
(ආ) ඉහත iii (අ) සඳහා ඔබ සඳහන් කළ එක් එක් නිෂ්පාදන සාධකය සඳහා සිද්ධිය ඇසුරින් නිදසුන බැගින් ලියන්න. (ලකුණු 02)

4. අනුරාධපුර පූජා භූමිය අසල ජීවත් වන සපුමලී ඇගේ සොයායුරාගේ සහය ඇතිව ප්‍රදේශයේ වැව්වලින් මල් නෙලාගෙන පූජා භූමියට එන වන්දනාකරුවන්ට අලෙවි කරයි.
(අ) සපුමලීගේ ව්‍යාපාරය කෙරෙහි උනන්දුවක් දක්වන ඉහත සිද්ධියේ සඳහන් පර්ශවයන් සඳහන් කර එම පාර්ශවය ව්‍යාපාරය කෙරෙහි උනන්දුවක් දැක්වීමට හේතුවක් ලියන්න.
(ආ) සපුමලීගේ ව්‍යාපාරය කරගෙන යාමට ඇති අවස්ථා 2ක් ලියන්න. (ලකුණු 02)

(03) 1. (අ) ව්‍යාපාර සංවිධානයක් යනු කුමක්ද?
(ආ) පරිමාණය අනුව ව්‍යාපාර සංවිධාන වර්ග කිරීමේදී භාවිතා කරන ප්‍රමාණාත්මක නිර්ණායක 2ක් ලියන්න.
(ලකුණු 02)

2. පහත සඳහන් ප්‍රකාශ සත්‍යද, අසත්‍යද යන්න දක්වන්න.
(අ) සමුපකාර සමිති සංවිධානය පොදු අංශයේ ව්‍යාපාරයකි.
(ආ) සංස්ථාපිත සමාගම් වල නීතිමය විධි විධාන අධික වේ.
(ඉ) පොල් සංවර්ධන අධිකාරිය සංස්ථාපිත සමාගමකි.
(ඊ) හවුල් ව්‍යාපාරයකට අඛණ්ඩ පැවැත්මක් ඇත. (ලකුණු 02)

3. ගැමුණුපුර ගම් ප්‍රදේශයේ පහත ව්‍යාපාර පවත්වාගෙන යයි.
සීමාසහිත පුබුදු සමාගම
රුසිරු ස්ටෝර්ස්
රන්තරු ක්‍රීඩා සමාජය
සී/ස ගැමුණුපුර සමුපකාර සමිතිය
(අ) ඉහත ව්‍යාපාර ආයතන වලින් ලාභ අරමුණු කරගත් ව්‍යාපාර 2ක් ලියන්න.
(ආ) සීමාසහිත පුබුදු සමාගමේ දැකිය හැකි ලක්ෂණ 2ක් ලියන්න. (ලකුණු 02)

4. අමල් සහ කමල් වරලත් ගණකාධිකාරිවරුන් දෙදෙනෙකි. ඔවුන් දෙදෙනා එකතු වී විගණන ආයතනයක් පවත්වාගෙන යයි.

(අ) අමල් සහ කමල් විසින් පවත්වාගෙන යන ව්‍යාපාරය කුමන ව්‍යාපාර වර්ගයට අයත් වේද?

(ආ) මෙවැනි ව්‍යාපාරයක අවාසි 2ක් ලියන්න. (ලකුණු 02)

(04) 1. (අ) විද්‍යුත් මුදල් යන්න හඳුන්වන්න.

(ආ) ජංගම ගිණුමක් පවත්වාගෙන යාමේ වාසි 2ක් ලියන්න. (ලකුණු 02)

2. පහත සඳහන් ප්‍රකාශ සත්‍යද අසත්‍යද යන්න දක්වන්න.

(අ) සිල්ලර වෙළඳාමේ දී පාරිභෝගිකයාට සමීප නොවේ

(ආ) මුදල් ගැනීම සඳහා රේඛිත චෙක්පත බැංකු ගිණුමක තැන්පත් කළ යුතුයි.

(ඉ) දේපළ රක්ෂණයට හානි පූර්ණ මූලධර්මය බලපායි.

(ඊ) වෙළඳපළක් යනු ගැණුම්කරුවන් හා විකුණුම්කරුවන් හමුවන නිශ්චිත ස්ථානයකි. (ලකුණු 02)

3. (අ) දිමුතු ශ්‍රී ලංකා රක්ෂණ සමාගමෙන් රු.600000කට ජීවිත රක්ෂණයක් ලබාගෙන ඇත. ඔහු හදිස්සියේ මිය යෑම නිසා ඔහුගේ බිරිඳ වන නිපුණිට ජීවිත රක්ෂණයට අදාල වන්දි මුදල ගෙවන ලදී. මෙම සිද්ධියේ සඳහන් රක්ෂිතයා හා රක්ෂකයා නම් කරන්න. (1/2 x 2 ලකුණු 01)

(ආ) රථවාහන ධාවනය සඳහා බලය ලබා ගැනීමට නව සූර්ය බල පද්ධති හඳුන්වාදීමට තීරණය කරයි. ඉහත ප්‍රකාශයේ සඳහන් ප්‍රවාහනයට සෘජුවම සම්බන්ධ වන ප්‍රවාහන මූලිකාංගය නම් කරන්න. (ලකුණු 01)

4. (අ) බෑග් නිෂ්පාදනය ආයතනයක් පවත්වාගෙන යන ජීවක ඉහළ ප්‍රමිතියෙන් යුත් පාසල් බෑග් නිෂ්පාදනය කිරීමට තීරණය කරන ලදී. ඒ සඳහා අවශ්‍ය නවීන තාක්ෂණයෙන් යුත් යන්ත්‍ර 02ක් මිළදී ගන්නා ලදී. තම නිෂ්පාදන කළමණාකරු තත්වපාලකට අවශ්‍ය උපදෙස් සපයන අතර නිෂ්පාදන ක්‍රියාවලියේ සෑම අවස්ථාවකදීම තත්ව පාලක විසින් නිෂ්පාදිතයේ ගුණත්වය පරික්ෂා කරයි.

කළමණාකාර්යය හතර දක්වා එම එක් එක් කාර්ය සඳහා නිදසුන් ඉහත සිද්ධිය ඇසුරින් තෝරා පහත ආකාරයේ වගුවක සඳහන් කරන්න.

| කළමණාකරන කාර්යය | සිද්ධියේ සඳහන් නිදසුන |
|---|---|
| | |
| | |
| | |
| | |

(ලකුණු 02)

(05) i. (අ) ගිණුම්කරණයේ අරමුණු කුමක්ද?

(ආ) වගකීමක ලක්ෂණ 02ක් ලියන්න. (ලකුණු 02)

ii. අවිශ්කගේ ව්‍යාපාරයේ 2017 ජනවාරි මාසයේ සිදුවූ ගණුදෙනු පහත දැක්වේ.

1. රු. 500,000 ක් ප්‍රාග්ධනය ලෙස යෙදවීම.
2. රු. 125,000 ක බැංකුණයක් ලබාගැනීම.
3. රු. 10,000 තොගයක් රු.15,000කට ණයට විකිණීම.
4. රු. 6,000 ක විදුලිය වියදම් ගෙවීම.
5. රු. 12,000 ක බැංකු ණය වාරිකය ගෙවීම මෙහි ඇතුලත් පොළිය රු. 2000කි.

අවශ්‍ය වන්නේ,

(අ) ඉහත එක් එක් ගණුදෙනුව ගිණුම්කරණ සමීකරණයට බලපාන ආකාරය පහත ආකෘතියට අනුව දක්වන්න.

| ගණුදෙනු අංගය | වත්කම් = | හිමිකම් | + වගකීම් |
|---|---|---|---|
| 1 | + 500,000 | + 500,000 | |
| 2 | | | |
| 3 | | | |
| 4 | | | |
| 5 | | | |

(ලකුණු 02)

(ආ) ඉහත ගණුදෙනු අවසානයේදී ව්‍යාපාරයේ හිමිකම ගණනය කරන්න. (ලකුණු 02)

iii. පහත ගණුදෙනු වලට අදාල ද්විත්ව සටහන් ලියන්න.

(අ) රු: 10000ක ස්ථාවර තැන්පතුවක් ආරම්භ කිරීම.

(ආ) රු: 4000ක අයිතිකරුගේ නිවසේ විදුලි බිල ව්‍යාපාරයේ මුදලින් ගෙවීම. (ලකුණු 02)

iv. දිනුකගේ ව්‍යාපාරයේ 2017 ජනවාරි මාසයේ සිදුවූ ගණුදෙනු කිහිපයක් පහත දැක්වේ.

| | |
|---|---|
| 2017.01.01 | දිනට මුදල් ශේෂය රු. 65,000කි. |
| 2017.01.02 | අත්පිට විකුණුම් රු. 12,000 |
| 2017.01.05 | ණය හිමි අනුරට ගෙවීම රු. 8,000 |
| 2017.01.17 | බැංකුවේ තැන්පත් කිරීම් රු. 10,000 |
| 2017.01.19 | විදුලි බිල ගෙවීම රු. 2,000 |
| 2017.01.20 | බැංකු ණය ලබාගැනීම රු. 40,000 |
| 2017.01.22 | ණයගැති ලැබීම් රු. 15,000 |
| 2017.01.28 | ස්ථාවර තැන්පතුවක ආයෝජනය කිරීම රු. 25,000 |

අවශ්‍ය වන්නේ,

මුදල් පොත පිළියෙල කර 2017.01.31 දිනට තුලනය කරන්න. (ලකුණු 04)

(06) i. (අ) ව්‍යාපාරයක් විසින් බැංකු සැසඳුම් ප්‍රකාශයේ පිළියෙල කිරීමේ මූලික අරමුණ කුමක්ද? (ලකුණු 01)

(ආ) බැංකු ගිණුම් පිළියෙල කිරීමේදී යොදා ගනු ලබන ප්‍රභව ලියවිලි 2 ක් දක්වන්න. (ලකුණු 01)

ii. සඳරුවන්ගේ ව්‍යාපාරයේ 2018/1/31 දිනට පිළියෙල කළ බැංකු ගිණුමේ ශේෂය රු. 21,500ක් වූ අතර එම මාසය සඳහා බැංකුවෙන් එවන ලද බැංකු ප්‍රකාශයේ ශේෂය ඊට වෙනස් විය. පසුව පහත වැරදි සොයා ගන්නා ලදී.

- තැන්පත් කරන ලද පහත චෙක්පත් තවමත් උපලබ්ධි වී නොමැත.

  චෙක්පත් අංක - 0178 - 1500

  චෙක්පත් අංක - 0271 - 6000

- බැංකුව විසින් රු. 1,000ක බැංකු ගාස්තු හා ස්ථාවර නියෝග මත රු. 3,000ක රක්ෂණ ගාස්තු ගෙවා ඇත.
- ණයගැතියෙකු වූ රුවන් රු. 5,000ක් ඍජුවම බැංකුවේ තැන්පත් කර ඇත.
- ණයහිමියාට නිකුත් කළ රු. 8,000ක චෙක්පත තවමත් බැංකුවට ඉදිරිපත් වී නොමැත.

  අවශ්‍ය වන්නේ,

  (අ) සංශෝධිත බැංකු ගිණුම

  (ආ) බැංකු සැපයුම් ප්‍රකාශය (ලකුණු 04)

iii. අමන්දගේ ව්‍යාපාරයේ 2017/12/31 දිනෙන් අවසන් වර්ෂය සඳහා පිළියෙල කළ මුදල් පොතේ ලද වට්ටම් තීරුවේ එකතුව රු. 5200 ක් වූ අතර දුන් වට්ටම් තීරුවේ එකතුව රු. 2900ක් විය.

ඉහත වට්ටම් ගිණුම්ගත කිරීමට අදාල ජ'ර්නල් සටහන් දක්වන්න. (ලකුණු 02)

iv. මහීපාලගේ ව්‍යාපාරයේ 2018/01/01දිනට සුළු මුදල් ගිණුමේ ශේෂය රු. 280 ක් වූ අතර සුළු මුදල් අග්‍රිමය රු. 2000 කි. 2018/01/31 දිනට එනම් ජනවාරි මාසයේ පහත වියදම් දරා ඇත.

| | | | |
|---|---|---|---|
| ගමන් වියදම | 510 | ලිපි ද්‍රව්‍ය | 220 |
| සංග්‍රහ වියදම් | 500 | තැපැල් වියදම් | 120 |
| විමුක්තිට ගෙව්වා | 400 | | |

අවශ්‍ය වන්නේ,

1. ජනවාරි 31 දින ප්‍රතිපූරණය කළ යුතු වටිනාකම
2. ඉහත සුළු විදයම් ලෙජර් ගිණුම් වල පිටපත් කර දැක්වීම (ලකුණු 04)

(07) i. අරවින්දගේ ව්‍යාපාරයේ 2017 ජනවාරි මාසය තුළ සිදුවූ ගණුදෙනු පහත පරිදි වේ.

1/5 රවීගෙන් මිලදී ගැනීම් රු. 10,000 අඩු කළ වට්ටම් 10%කි.

1/8 අමල්ගෙන් මිලදී ගැනීමේ රු. 15,000

1/12 අත්පිට ගැණුම් 20,000

1/15 අත්පිට විකුණුම් 28, 000

1/21 නාමල්ට විකුණුම් 12,000

1/25 කීර්තිට විකුණුම් 15,000 අඩුකළ වට්ටම් 10%කි.

අවශ්‍ය වන්නේ,

(i) ඉහත ගණුදෙනු ආශ්‍රයෙන් ගැණුම් ජර්නලයේ හා විකුණුම් ජනලය පිළියෙල කරන්න.

(ii) ගැණුම් ජර්නලයට අදාල තොරතුරු පමණක් ලෙජර් ගිණුම් වලට පිටපත් කරන්න.

(ලකුණු 04)

ii. 2017.03.31 දිනට සුමුදුගේ ව්‍යාපායේ ශේෂ පිරික්සුමේ බැර පැත්ත රු: 700ක් අඩු විය පසුව පහත වැරදි සොයා ගන්නා ලදී.

(i). ගෙවූ රක්ෂ වියදම රු 4200 ක් මුදල් පොතේ පමණක් සටහන් වීම.

(ii). රු: 4000 ක කුලී ආදායම් ගිණුමේ ශේෂය ශේෂ පිරික්සුමට පිටපත් කර නැත.

(iii). රු: 3400 ක ලද වට්ටම අදාල ණය හිමි ගිණුමේ රු: 4300 ක් ලෙස සටහන් වීම.

**අවශ්‍ය වන්නේ,**

(අ) ඉහත වැරදි නිවරදි කිරීමේ ජ්නල් සටහන.

(ආ) අවිනිශ්චිත ගිණුම. (ලකුණු 04)

iii. (අ) පොදු ජ' නලයක සටහන් කල හැකි ගණුදෙනු සඳහා උදාහරණ දෙකක් සපයන්න.

(ආ) අසිතගේ ව්‍යාපාරයේ 2017.3.31 දිනට පහත ශේෂ දක්නට ලැබුණි.

| | |
|---|---|
| ප්‍රාග්ධනය | 430,000 |
| ගැනුම් | 170,000 |
| වියදම් | 225,000 |
| ණය ගැති | 28,000 |
| ණය හිමි | 15,000 |
| 10 % බැංකු ණය | 30,000 |
| ඉඩම් ගොඩනැගිලි (පිරිවැයට) | 400,000 |
| කාර්යාල උපකරණ | 100,000 |
| විදුලිය | 4,000 |
| ගැනිලි | 4,000 |
| රක්ෂණය | 5,000 |
| කොමිස් ආදායම | 30,000 |
| බැංකු ණය පොලිය | 3,000 |
| අතැති මුදල් | 10,000 |

**අවශ්‍ය වන්නේ,**

ඉහත ශේෂ ඇසුරින් අසිතගේ ව්‍යාපාරයේ 2017.03.31 දිනට ශේෂ පිරික්සුම පිළියෙල කරන්න.

(ලකුණු 03)

* * *